පළමු වාර පරීක්ෂණය 2022
මීරිගම අධ්‍යාපන කොට්ඨාසය
11 ශ්‍රේණිය
deomirigama@gmail.com 0332273562

# සිංහල භාෂාව හා සාහිත්‍යය 1

කාලය පැය 03

සැළකිය යුතුයි

I. සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍ර සඳහා ලකුණු 40 ක් ලැබේ.
II. අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලදි ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
III. ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දීඇති කව අතුරෙන් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
IV. එම උත්තර පත්‍රයේ පිටුපස දි ඇති අනෙක් උපදෙස් ද සැළකිල්ලෙන් කියවා ඒවා දපිළිපදින්න.

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

1. ගැමියෝ අවුරුදු නැකතට බුලත් හුරුලු දි ආචාරකොට පරණ **නෝක්කාඩුකම්** අමතක කර දමති.

1. උඩගුකම් 2.මෝඩකම්
3. වෙනස්කම් 4. අමනාපකම්

2. ඇතමුන් **නීතිය අතටගෙන** කටයුතු කිරීමෙන් මහජනතාව අසීරුතාවට පත්වන බව සංවර්ධන සභා රැස්වීමේ දි ප්‍රකාශ විය .

1. ක්‍රියාත්මක කිරිමට ඉඩ නොතබා 2. හැල්ලුවට පත් කරමින්
3. අක්‍රියභාවයට පත්කොට 4. අයථා පරිදි යොදාගෙන

3. සරුවට වැවී තිබුණු කුඹුරු යාය ගංවතුරට විනාශ වී යාමෙන් විශාල මුදලක් **වතුරේ ගිය බව** ගොවිහු මැසිවිලි නැගුහ,

1. සේදී ගිය 2. අපතේ ගිය
3. ගංවතුර හසු වූ 4.යට වී ගිය

අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න .

4. විස්තරාත්මකකොටසක් . ....................කොට දැක්වීමේ හැකියාව සාරාංශකරණය නම්වෙයි

1. සම්ප්‍රේෂණය 2.සම්පාදනය 3. සම්භවනය 4. සම්පිණ්ඩනය

5. කලාපයේ අධ්‍යාපන සංවර්ධනය පිළිබඳව ප්‍රගති . ......................රැස්වීමක් පසුගියදා පැවැත්විණි.

1. සමාලෝචන 2. සමීක්ෂණ 3. සමාප්ත 4. සම්බන්ධ

6. ශ්‍රී ලංකා භූමි සීමාව . ...................කළ බලංගොඩ ආනන්ද මෛත්‍රී හිමියන්ගේ ධර්ම ශාස්ත්‍රීය සේවාව පෙරදිග රටවල මෙන් ම අපරදිග රටවල ද පැතිරිණි.

1. උත්පාදනය 2. සමතික්‍රමණය 3. සංසන්දනය 4. අතික්‍රමණය

7. නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුක්ත පද තෝරන්න

1) පරිඝණකය , සම්ප්‍රදාය , මධ්‍යසාරය , ශිෂ්ඨාචාරය

2)දර්ශනය , වීරෝදාර , දෘෂ්ටියල , ලේඛනය

3) අතිශෝක්තිය , ආකර්ෂණය , දේශපාලඥයා , ළදරුවා

4)පුස්තකාලය , කලමනාකරු , භාධකය , සලකුණ

8. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.

1. ඓතිහාසික , දෘෂ්ටිය, ඖෂධාලය, සම්ප්‍රධාන

2. ප්‍රස්තාරය, ප්‍රභල, ප්‍රදර්ෂණය, ව්‍යවස්තාව

3.මර්දනය, සම්ප්‍රදාය, පුස්ථකාලය, සංකේතය

4. ශිෂ්ටාචාරය, වලාකුළ, මද්‍යසාර, සමස්තය

9. ගයනුකිත්ත, ඇලපිල්ල, ඉස්පිල්ල, පාපිල්ල අනුපිළිවෙලින් යෙදුණු පද දැක්වෙන පේළිය තෝරන්න.

1. ඓරාවණ, සෞඛ්‍ය, ආධුනික, ත්‍රිවය

2. මෞර්ය, සාහිත්‍ය,පරිවාර, කරුමය

3. නෞකාව, කාමරය, සුදන්ත, ඖචිත්‍යය

4. පෞරාණික, වෛරය, කුලගර්වය, සුමිහිර

10. ළමයා යන පදයෙහි බහුවචන අනුක්ත පදය

1) ළමයි ය 2) ළමෝ ය 3) ළමයින් ය 4) ළමුන් ය

11. උක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

1. සේ කරයාණෝ, ගුරුවරයෙක්, ලේඛකයෝ, තොප

2. ළමයි, මිනිසා, සිංහයෙක්, ශිෂ්‍යාවක

3. අප, මම, රෝගියෙක්, සේවිකාව

4. නිලධාරියෙක්, ගායිකාවක්, නුඹ, සමහරෙක්

12. "කුමාරයාගේ " යන පදයේ ප්‍රකෘතිය හා ප්‍රත්‍ය වෙන්කළ විට නිවරැදි පිළිතුර වන්නේ

1. කුමාර+ආගේ 2. කුමාර+යාගේ

3. කුමාරයා+ අගේ 4. කුමාර +අගේ

13. අතීත ජනයා වැසි ජලයෙන් ගොවිතැන් කිරීමට පුරුදු වී සිටියහ. මෙහි "වැසි ජලයෙන්" යන්න අයත් වනුයේ

1. අන්‍යාර්ථ සමාසයට 2. විශේෂණ සමාසයට

3. විභක්ති සමාසයට 4. අව්‍ය සමාසයට

14. වාක්‍ය අතුරෙන් ව්‍යාකරණානුකූල නිවැරදි වාක්‍යය තෝරන්නග

1)දූව හොරුන් ඇල්ලීමට ගිය නිලධාරීන් දක්ෂයෝය.

2)දූරියන් සමග මහ මඟට ආ කාන්තාවක් නයෙක් දැක බිය වූවාය.

3)පෙරහැර නරඹන්නන්ට ඇතැමෙක් උසුළු විසුළු පෑහ.

4)සිරිදාස තම මෑණියෝ අදරින් සමරති.

15. "බලති" යන ක්‍රියා පදයේ ප්‍රථම පුරුෂ බහුවචන අතීත කාල ක්‍රියාපදය වන්නේ,

1. බැලුවහු 2. බලති

3. බැලුවෙනු 4. බලනු ලබති

16. කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාවක් ඇතුළත් වර්ණය තෝරන්න.

1. ඇසුවොත් 2. අසමින්

3. අසවයි 4.අසද්දී

- අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේඅර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

17. සාහිත්‍යකරුවා යොදාගත් භාෂාවේ විශේෂ ලක්ෂණයක් වන්නේ **භාවික** ගුණයයි.

1. අර්ථාන්විත විම 2. හැගීම් දැනවීම 3. සුලලිත බව 4. නැවුම් බව

18. ඉකුත් දශක දෙක තුළ සිංහල ගීතය **භාවපූර්ණ** සුනිශිත සාහිත්‍යය නිර්මාණයක් බවට පත්විය

1.අර්ථ සපිරුණු 2. හැගීම් වලින් සපිරුණු

3. රසයෙන් සපිරුණු 4. ශබ්දවලින් හා අර්ථයෙන් සපිරුණු

19. තෝරාගත් මාතෘකාව පිළිබද තොරතුරු තවදුරටත් ගවේෂණය කළයුතු බව කාගේත් අදහස විය.

1. ගැඹුරින් සොයා බැලීම 2. කෙටිකර දැක්විම

3. සවිස්තරාත්මක දැක්වීම 4. නිවැරැදිව ඉදිරිපත් කිරීම

20. දී ඇති වචන ගොනු අතරින් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයක් සමඟ බැදී නොපවත්නා පද පේළිය තෝරන්න.

1. නාම්බුව, ඉල්ලම, දබරය, දෝනාව

2. මරක්කලාගේ ජම්පර කළුව, ජාලය,අලුයම් පොළ

3.උප්පිඩ, බාන, යතුර,දෙබරත

4. වංපතුල්, මහ එකා, ගැදැල්ල ගෑම, අළුහන් වැඩිම

21. වාක්‍ය අතුරෙන් ව්‍යාකරණානුකූල නිවැරදි වාක්‍යය තෝරන්නග

1) පොලීසිය විසින් හොර මුළ අත් අඩංගුවට ගනිතිග
2) ගුරුවරුන් වූ කලී සමාජ සේවකයන් යැයි ඇමතිතුමා කී යග
3) මා අත තිබූ වැදගත් ලියවිලි රාශියක් බස්රියේදී නැති වූහග
4) ජාතික සංවර්ධනයෙහි ලා තරුණයන් උනන්දු වෙති යි කවුරුත් කියති

22. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

1. පාර, වීථිය , මාර්ගය , මාවත, මඟ

2. නිවාසය - ගෙය, ගෘහය, නිවස,නිවහන

3. දාගැබ - සෑය, චෛත්‍ය, ස්ථූපය, ආරාමය

4. පර්වතය , පව්ව , ගිර, කන්ද, ශිඛරය

23. විරුද්ධාර්ථවත් පද යුගලයක් නොවන වරණය තෝරන්න.

1. ප්‍රපාතය - මස්තකය 2. සම්භාවනිය - නින්දනිය

3. සංවෘත - ආවෘත 4. සාමූහික - ඒකල

තද කළු අකුරින් මුද්‍රිත කොටස්වල අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පද කැටිය තෝරන්නග

24 **කන්ද කෙන්ද කොට දක්වීමේ ලා** ඇතැම් කවීකයෝ මහ හපන්නු ය

1) නිසරු දේ ප්‍රසිද්ධියට පත් කිරීමට 2) වැදගත් දේ සුළුකොට ගෙන හැර පෑමට

3) නිෂ්ඵල දේට ප්‍රධාන තැනක් දීමට 4) අතිශයෝක්තියෙන් කරුණු මතුකර දක්වීමට

25. ල **ලිපිගොන නුවලට ම යට වී** කෘෂිකර්මය දියුණු කළ හැකි ද?

1) පර්යේෂණවලට ම වහල් වී

2) ලියවිලි ගැන තැකීමක් නො කොට

3) ලිපි ලේඛන ගැන ම සැලකීමෙන්

4) රාශිගත තොරතුරු පසෙක ලා

අංක 26, 27 ප්‍රශ්නයටතේ දී ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රඥාව පිරුළු අන්තර්ගත වරණය තෝරන්න.

26. "නිතර දෙවේලේ දකින කුකුළාගේ කරමලය සුදුලු"

1. යමක් නිතර නිතර දැකිමෙක් එය ඇසට හුරු පුරුදු වන බව

2. නිතර දැකිමෙන් යමක අගය අඩුවන බව

3. යම් දෙයක් නිරතුරුව දැකිමෙන් එහි පැහැය වෙනස්ව යනෙන බව

4. කුකුළාගේ කරමලය සැබැවින් ම සුදු පැහැ බව

27. "හිල් කුඩෙන් වතුර අදිනවා වගේ"

1. යම් දෙයකට කිසියම් උත්සාහයක් ගැනිම 2. උත්සාහයක් මගින් ජයක් ලැබීම

3. යම් කාර්යයක් සිතා බලා කිරීම 4. නිෂ්ඵල දෙයක් සඳහා මහන්සි වීම

28. "ජාඩියට මුඩිය වගේ"

1. අවදානම් වැඩක් කිරිම 2. සුදුසු නොවන දෙයක් කිරීම

3. සමාන අදහස්දැරිම 4. තැනට සුදුසු දෙයක් කිරිම

- අංක 29,30 යටතේ දී ඇති ප්‍රශ් නවල ව්‍යාකරණානුකූලව නිවැරුදි වාක්‍යය තෝරන්න.

29. 1. සභා තොමෝ සතුටින් විසිර ගියහ.

2. සභා තොමෝ සතුටින් විසිර ගියාය

3.සභා තොමෝ සතුටින් විසිර ගියේය.

4. සභා තොමෝ සතුටින් විසිර ගියෝය.

30. 1. ඔවුහු සියල්ලෝ ම මා හමුවට පැමිණියහ. 2. ඔවුන් සියල්ලෝ ම මා හමුවට පැමිණියහ

3. ඔවුහු සියල්ලන් ම මා හමුවට පැමිණියෝය. 4. ඔවුන් සියල්ලන් ම මම හමුවට පැමිණියෙමි

31. 1. මහා සභාව පසු ගියදා යළි රැස් වූවාය

2. සියල්ලෝ ම උත්සව ගැන කතා කළේ දැඩි සතුටිනි.

3. ඇතැමුන් ගී ගයද්දී සමහරු නැටුහ.

4. ඔබ පොත පත කියවා හොඳ උගතකු වන්න.

32. (A) අත්දැකීම් ඇසුරු කරගෙන සිත . .........................උපන් හැඟීම් කාව්‍ය නිර්මාණකරණයයි.

(B) සාහිත්‍ය නිර්මාණ . .......................... කවිය හෙවත් කාව්‍යයට විශේෂ ස්ථානයක් හිමිවේ.

(C) ව්‍යුත්පත්තිය යනු කාව්‍ය නිර්මාණකරණය .

...................................................................විවිධ විවධ ශාස්ත්‍ර හා විෂය සම්බන්ධ පරිණත අවබෝධයයි.

(D) සිතේ තැන්පත් වූ අත් දැකීමක් කවියක් . ......................... බිහිවීමට සැළකිය යුතු කාලයක් ගතවිය හැකිය.

ඉහත වාක්‍යවල හිස්තැන්පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනු පිළිවෙල කුමක්ද ?

E - මෙන්ම F - අතරින් G - තුළ H - ලෙස

1. E,F,G,H 2. G,F,E,H 3. H,G,F,E 4.F,H,G,E

33. එක් එක් වචනවල මුලකුරෙහි ඇදය, පාපිල්ල, ඉස්පිල්ල, ඇලපිල්ල පිළිවෙලින් යෙදී ඇති වචන සහිත පද පේළිය තෝරන්න.

1. ගිරය, මාලය, රුවන්, නුවණ 2. හැන්ද, තුඹල්, මාර, දිනය

3. වැලි, පුවක්, දෙමට, කැටය 4. පැය, කුඩය, නියර, වාසල

34. A ප්‍රයත්නය - උත්සාහය

B යටපත් කිරීම - ස්මරණය

C අසපුව - අරම

D විශේෂ - වරණය

A,B,C,D, යෙදුම් යුගල අතුරෙන් නිවැරදි යුගල වන්නේ

1. A හා B 2. B හා D 3. B හා C 4. A හා C

35. මිහිලිය නළලේ අංජන තිලකේ

සිරි ලංකා දෙරණේ

තිසරණ සරණින් භූ පාලනා

ජනතා දිනේ දිනේ . .................
මේ ගීත කාණ්ඩයේ නිර්මාණකරු වූයේ

1. මහගම සේකරයන් 2. සිරි ගුණසිංහයන්
2. ඩබ්.ඩී.අමරදේවයන් 4. සුනිල් ආරියරත්නයන්

36. පහත සඳහන් කවියේ සිව්වන පදය තෝරන්න.

උඹේ කරට මල් මාලා ගොතන්නට

මදුමල් පිපෙනවා හේනේ වැට දිගට

උඹේ කටින් ගී සිපද අසන්නට

.........................................................................

1. හීනෙන් ඇවිත් නැනා අත වනන්නේ
2. පැලේ ගින්න විතරයි තනියට ඇත්තේ
3. ළමා ළපටි නැනා කොයි ගියාදෝ
4. තවමත් ගිරවු එනවා පෙර පුරුද්දට

37. මාර්ටින් වික්‍රමසිංහයන්ගේ කෙටි කතාවකි.

1. ගස් 2. වෙසක් පහන

3. වහල්ලු 4. ගමන

38. "කූටාලම" භාවිතා වන්නේ

1. කමත් බස් වහරේ දි 2. ධීවර බස්වහරේ දි

3. හේන් බස්වහරේ දි 4. පතල් බස්වහරේ දි

39. "අබිලින් උන්නැහෙ, ටිකකට මෙහාට ඇවිදිල්ල යමුකො" මේ කොටස උපුටා ගෙන ඇත්තේ.

1. හුණුවටය නාට්‍යයෙන් 2. වතුර මල කතාවෙන්

3. තල මල පිපිලා නාට්‍යයෙන් 4. තොරොක්කෝව කතාවෙන්

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.

ධනවත් ජාතීන්ගේ ආධාර උපකාර නැතිව ලෝක ආහාර හිඟයට පිළියම් යෙදීම අසීරු කරුණකි.

1. ලෝක ආහාර හිඟය නැති කිරීමේ කටයුතු ධනවත් ජාතීන්ගේ න්‍යාය පත්‍රයට ඇතුළත්ය.
2. ලෝකයේ කෘතිම ආහාර හිඟයක් මවා පෙන්වීමට ධනවත් රටවල් බලවත් උත්සාහයක යෙදෙයි
3. ලෝක ආහාර හිඟය නැති කිරීම සඳහා පොහොසත් ජාතීන්ගේ දායකත්වය අවශ්‍යය
4. ඇතැම් ජාතීන්ගේ අවධානය යොමු වී ඇත්තේ ලෝකයේ ආහාර සුලබ කිරීම කෙරෙහිය.

deomirigama@gmail.com 0332273562


සිංහල භාෂාව හා සාහිත්‍යය 11

(1) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(1) පහත දැක්වෙන අකුරු ඇතුළත් කොට අර්ථවත් වචනයක් බැගින් ලියන්න

(අ) ඣ ..............................................................................................................

(ආ) ඓ ..............................................................................................................

(11) සිංහල වර්ණ මාලාවේ සඤ්ඤක අක්ෂර ලියා දක්වන්න

..............................................................................................................................

(111) ............................................පහත සඳහන් පද විසන්ධි කොට සන්ධි වර්ගය ලියන්න.

(අ) මිහින්තලය

(ආ) කොස්සැට

(1V) පහත සඳහන් ප්‍රකාශවලට අදාළ තනි පදය බැගින් ලියන්න.

(අ) එකිනෙකට සම්බන්ධව පවතින

(ආ) ආගමට තමා දක්වන ආදරය

(V) පහත වාක්‍ය නිවැරදි කර ලියන්න

අ) මම ගමට එතීයි අම්මා මඟ බලා සිටියා ........................................................................

ආ) සේවකයන් වැඩ නවත්වා උද්ඝෝෂණයට එකතු වූහ ................................................

(VI) පහත සඳහන් වාක්‍ය සදොස් නම් නිදොස් කරන්න.

(අ) අපි හොඳින් පාඩම් කරති ? යි ගුරුතුමිය සිතුවාය.

(ආ) වෛද්‍යවරුන් රෝහලේ ඇත.

(VII) පහත සඳහන් කර්ම කාරක වාක්‍ය කර්තෘ කාරකයට හරවන්න.

(අ) ගොපල්ලා විසින් ගවයෝ බලනු ලබති.

(ආ) මිතුරන් විසින් මම දකින ලද්දෙමි.

(VIII) පහත සඳහන් පද කුමන සමාස වර්ගයකට අයත් වේ ද?

අ) කුරුළුනාදය .......................................

ආ) මැතු මැණික් ...................................

(IX) පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍යදෙකක් ලියන්න.

(අ) කුලුණු

(ආ) කුලුනු

(X) පහත සඳහන් යෙදුම්වල පළමුවැනි හෝ දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවැනි වචනය හෝ දෙවැනි වචනය හෝ සකස් කරලියන්න.

(අ) සුන්දර සන්ධ්‍යාව

(ආ) සූර්ය මණ්ඩලය

( ලකුණු 02 X 10 = 20 යි)

02. පහත දැක්වෙන (අ) (ආ) (ඉ) (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන්තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනාව ලිවීම ආරම්භ කරන්න. යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) අද වන විට පෙරට වඩා බෝවන රෝග මෙන් ම බෝ නොවන රෝගවලින් ද ලෝකවාසීන් පීඩාවට පත් ව සිටිති. අතීතයේ තිබූ කොළරාව,වසූරිය, මැලේරියාව, වැනි රෝගාබාධ පාලනය කර තිබුණත් වර්තමානයේ දී විවිධ බෝවන රෝග පිළිබඳ ව අසන්නට ලැබේ. පිළිකා ,ඒඩ්ස්,කොරෝනා වැනි රෝගවලට තවමත් ඖෂධ සොයා ගෙන නොමැත. රෝග වැළඳීමට පසුව කරන ප්‍රතිකාරවලට වඩා රෝග වැළඳීමට පෙර පෞද්ගලික සෞඛ්‍ය මෙන් ම පොදු සෞඛ්‍ය පිළිබඳව සැලකිලිමත් වීම වඩා යෝග්‍ය වන අතර මේ පිළිබඳ අප රටේ ජනතාව දැනුවත් කිරීම ද වැදගත්ය.

(ආ) ලෝකයේ මෙන් ම අප රටේ බිහි වූ ශ්‍රේෂ්ඨයන්ගේ චරිත කතා කියවීමෙන් දරුවන් තුළ යහපත් ගුණ ධර්ම , දේශාභිමානය ආදිය වර්ධනය කළ හැක. ඒ සමඟ ම දුක දිනා ජයගත් ආකාරය තමාගේ චරිතයට ආදේශ කර ගැනීමෙන් තම පෞරුෂය සකස් කර ගත හැකි වනවා මෙන් ම අනාගත නායකත්වයට මෙන් ම රටේ දියුණුවට ද දායක කරගත හැකිය. අති පූජ්‍ය බලංගොඩ නායක ස්වාමීන්වහන්සේ, ධර්මපාලතුමා, වලිසිංහ හරිස්චන්ද්‍ර , ආචාර්යය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර, ටී.බී.ජයා , මහාචාර්යය සේනක බිබිලේ, ශ්‍රීමත් අයිවර් ජෙනිස් වැනි චරිත කියවීමෙන් ජීවිතයට ළගා කර ගත හැකි දේ රාශියකි. සිසුන් තුළ ආකල්ප ඇති කිරීමට ගුරුභවතුන්ගේද වගකීමකි.

(ඉ) විදේශාධාර ලංකාවට සම්පතකි. එහෙත් ඇතැම් විටෙක එයින් දේශයේ ස්වාධීනත්වයට අනිසි බලපෑම් ද එල්ල වේ. මෙය උභතෝකෝටික ප්‍රශ්නයක් වේ. ගැටලුව සැලකිල්ලට ගනිමින් අපගේ දේශය සමෘද්ධිය කරා මෙහෙයවීමට අවශ්‍යවන වැඩපිළිවෙල පහදන්න.

(ඊ) 21 වන සියවස අයත් වන්නේ ජනමාධ්‍යයන්ට බව බොහෝ දෙනාගේ මතයකි. ළමා ජීවිතවලට පමණක් නොව වැඩිහිටියන්ගේ ජීවිතයට ද ජනමාධ්‍ය එල්ල කරන්නේ ප්‍රබල බලපෑමකි. ඒ බලපෑම යහපත් විය යුතුය. අධ්‍යාපන සංවර්ධනයක් ජනතාව තුළ ඇති කිරීමට ද ජනමාධ්‍ය යොදා ගත හැකිය. යොදා ගත යුතුය.

(ලකුණු 25)

3. පහත දැක්වෙන පාඨය වචන 65 -75 අතර වන සේ සාරාංශකොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

මුල් යුගවලදී පහළ වූ විචාර ක්‍රමවලින් බොහෝ විට සිදු වුයේ සාහිත්‍යය නිර්මාණය කෙරෙහි අවධානය යොමු කරනු වෙනුවට ඊට පරිභාහිර වූ කරුණු මතු කොට දැක්වීමයි. සාහිත්‍යය කිසියම් සමාජ පසුබිමකින් බිහිවන හෙයින් සාහිත්‍ය කෘතියක් විමර්ශනය කිරීමේ දී ඊට පිටු දුන් සමාජය සහ එම සමාජය උතුම් කොට සැලකූ සම්ප්‍රදායයන් හා එම නියමයන් අවශ්‍යයෙන් ම සැලකිල්ලට ගත යුතු බව ඇතමුන්ගේ අදහස විය. මේ ක්‍රමය අනුගමනය කළ විද්වත්හු සාහිත්‍ය කෘතියට වඩා එහි සමාජ පසුබිම කෙරෙහි අවධානය යොමු කළහ.

සාහිත්‍ය විචාරකයාගේ අවධානය යොමු විය යුත්තේ සාහිත්‍ය කෘතිය ම කෙරෙහි මිස ඊට පරිබාහිරව හෝ ආගන්තුක වූ හෝ කරුණු කෙරෙහි නොවන බව අපි පිළිගනිමු නම්, මේ අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා විචාරකයන් විසින් කළ යුතුව ඇත්තේ කුමක්ද?

රචකයා සිය අත්දැකීම් ඉදිරිපත් කරන්නේ වචන මගිනි.රචකයා සිය නිර්මාණය පාඨකයා වෙත පමුණුවන වාහකය භාෂාවයි. ඒ නිසා විචාරකයා අවශ්‍යයෙන් ම සාහිත්‍ය කෘතියෙහි අඩංගු වචන මාලාව කෙරෙහි අවධානය යොමු කළ මනාය . භාවිත විචාර ක්‍රමය ගොඩනගා තිබෙන්නේ මෙම මුල ධර්මය මත පිහිටාගෙනය.

( ලකුණු 10 )

4. පහත දැක්වෙන ජේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා, ප්‍රජා සංවර්ධනය සහ සමාජ සුභ සාධන යනාදිය සහතික කරන පහසුකම් සහ යාන්ත්‍රණයන් සමාජ යටිතල පහසුකම් යන්නට ඇතුළත් වේ. සෞඛ්‍ය සාක්ෂරතාව සහ පාරිසරික තිරසර බව යන දර්ශකවලින් පෙන්වන පරිදි ජීවන තත්ත්වයේ ගුණාත්මකභාවය වැඩි දියුණු වීම සහ ආර්ථික සෞභාග්‍යය ළඟා කර ගැනීම අතර දැඩි සබඳතාවක් පෙන්නුම් කරයි. රටක සමාජ යටිතල පහසුකම් දියුණු වීම, ඉහළ ආර්ථික වර්ධනයක් අභිමුඛ කොට ගත් වඩාත් ඵලදායී සහ පූර්ණ නිපුණතා සහිත ශ්‍රම බලකායක් බිහි කිරීම කෙරෙහි බලපාන අතර එමගින් වඩාත් වේගවත් ආර්ථික වර්ධනයකට සහ සංවර්ධනයකට යොමු වීම සඳහා රටට අවශ්‍ය පරිණතභාවය ලබා ගැනීම තහවුරු කරනු ඇත. අධ්‍යාපනය සහ සෞඛ්‍ය සර්ව සහභාගීත්වයක් සහිත වර්ධනයක් සඳහා සෘජුව දායකත්වයක් සැපයිය හැකි ප්‍රධාන සමාජ යටිතල පහසුකම් වශයෙන් හඳුනාගෙන ඇත.

1. සමාජ යටිතල පහසුකම් ලෙස ලේඛකයා හඳුන්වන කරුණු මොනවාද?

2. ශ්‍රම බලකායක් බිහි කිරීම කෙරෙහි බලපාන සාධක ලෙස මෙහි දැක්වෙන්නේ කුමක්ද?

3. ජීවන තත්ත්වයේ ගුණාත්මක භාවය වැඩි දියුණු වීම සහ ආර්ථික සෞභාග්‍යතාවය ළඟා කර ගැනීම අතර පවත්නා දැඩි සම්බන්ධතාව පෙන්නුම් කරන දර්ශකය කවරේද?

4. රටට අවශ්‍ය පරිණතභාවය ලබා ගැනීම තහවුරු වන්නේ කෙබඳු මාර්ගයක් යටතේද?

5. අධ්‍යාපනය හා සෞඛ්‍යය හඳුනාගෙන ඇත්තේ කවර කාර්යය ක් සඳහා දායකත්වයක් සැපයෙන අංශයක් වශයෙන්ද?

(ලකුණු 02 x5 = 10 යි)

05. පහත සඳහන් විස්තරය පදනම් කරගෙන රාජකාරී ලිපියක් ලියන්න.

දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රදේශවාසීන්ගේ ජීවිතවලට මෙන් ම වගා කටයුතුවලට ද වන අලින්ගෙන් බාධා පැමිණෙමින් තිබේ. පාසල් දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලටත් සාමාන්‍ය මිනිසුන්ගේ එදිනෙදා කටයුතුවලටත් මෙමගින් එල්ල වන්නේ විශාල තර්ජනයකි. මෙම ව්‍යසනයට මුහුණ පා සිටින හබරණ ප දේශයේ පලුගස්වැව ග්‍රාමයේ ප්‍රජා සංවර්ධන සමිතියේ ලේකම් ධුරය හොබවන ඉන්දික තිලකරත්න ඔබ යයි සිතා , ගම්වාසීන් එකතු වී මෙම උවදුර මැඩපැවැත්වීම සඳහා සම්මත කරගත් යෝජනා හබරණ අඩවි වන නිලධාරී වෙත දන්වමින් ඒවා කඩිනමින් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කෙරෙන ඉල්ලීමක් ද සහිත ලිපියක් සකස් කරන්න.

(ලකුණු 15 යි)

නැතහොත්,

පහත දැක්වෙන විස්තරය පදනම් කරගෙන අත් පත්‍රිකාවක් සකස් කරන්න.

සම් සහ රෙදි උපයෝගී කරගෙන පාසල් බෑග නිෂ්පාදනය කිරීම පිළිබඳ ව ප්‍රදේශවාසී රැකියා විරහිත තරුණ ,තරුණියන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට වීරපුර ග්‍රාම සංවර්ධන සමිතිය කටයුතු සංවිධානය කර ඇත. ආරම්භක වැඩසටහන සඳහා අදාළ පිරිස සහභාගී කරවා ගැනීමට සුදුසු අත් පත්‍රිකාවක් සකස් කරන්න.

( ලකුණු 15යි)